


# හෙළබොදු සිරිතට යොමු වෙමු

තාත්තා මහ කන්නයේ කුඹුරේ අස්වැන්න ගෙට ගත්තේ හරි සතුටිනි. බැත රැගෙන එන අය පිළිගන්නට මෙන් අම්මා ද ඉදිරියට ආවා ය.

"ඕං සඳා අක්කේ සෝමෙ අයියට නම් මෙදා කන්නය ජයයි," කියමින් සියාතු කරේ තිබුණ වී මිටිය බිමට දැම්මේ ය.

"රත්නත්තරේ සිහිකරගෙන ගොවිතැන් කරන මට හැම දා ම ජයයි සියාතු ,"

යනුවෙන් තාත්තා ප්‍රකාශ කළේ හරි උජාරුවට ය. මේ අස්වැන්න ගෙන ඒමත් සමග අපේ නිවසේ චාරිත්‍ර ගණනාවක් සිදුකෙරේ. එහි දී මුලින් ම කෙරෙන කාර්යය වන්නේ අලුත් සහලින් දානය පිළියෙල කරගෙන පන්සලට ගොස් බුද්ධ පූජාව පවත්වා සඟ රුවනට දන් පිළිගැන්වීම ය. අනතුරුව සිදු කෙරෙනුයේ දේවාලයට රැගෙන යාම සඳහා අක්කියාල (දෙවියන්ට පුදන කොටස) වෙන් කිරීම ය. පසු ව වැඩිහිටියන් කිහිප දෙනෙකු හා කුඹුරු වැඩට උදවු වූ සියලු දෙනා කැඳවා ඔවුන්ට අලුත් සහලින් පිසින ලද ආහාරයෙන් සංග්‍රහ කරනු ලැබේ. කිරි අම්මාවරුන්ට දානය පිරිනැමීම ද අස්වැන්න නෙළාගත් පසු සිදු කෙරෙන මූලික චාරිත්‍රවලින් එකකි.

ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ජන සමාජය තුළ මෙම සිරිත් ඉටු කරනු දක්නට ලැබේ. මෙරට ජන සමාජය මේ උතුම් චාරිත්‍රවලට යොමු වූයේ මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් බුදු දහමත් සමග බැඳුණු සංස්කෘතිය නිසා ය. නිතර විහාරස්ථානය ඇසුරු කළ අපේ පැරණි ජන සමාජය උතුම් චාරිත්‍ර වාරිත්‍ර රාශියක් තුළින් තම ජීවිතය සරු කරගත්තේ ය. කෘෂි චාරිත්‍ර හැරුණු විට

වැඩිහිටියන්ට සැලකීම, ආගන්තුක සත්කාරය, කළගුණ සැලකීම, අන්‍යයන්ට උපකාර කිරීම, අසරණයින්ට පිහිට වීම, අග්‍රශස්‍ය දානය ලබාදීම ආදී බොහෝ ගුණාංග ඒ අතර වේ.

## වැඩිහිටියන්ට සැලකීම

දිනපතා ව්‍යවහාරයේ වැඩිහිටියන් ලෙස හැඳින්වෙනුයේ අපට වඩා වයසින් වැඩිමහලු වූවන් ය. තම දෙමවුපියන්, ගුරුවරුන්, පූජ්‍ය උතුමන් හා තමනට වඩා වයසින් වැඩි සියලු දෙනා ම වැඩිහිටියෝ වෙති. තමනට වඩා වයසින් බාල වුව ද ගුණයෙන්, නුවණින් අපට වඩා උසස් අය ද වැඩිහිටියන් ලෙස සැලකෙති. ඔවුනට නිසි සැලකිලි දැක්වීම වයසින් හා ගුණයෙන් අඩු අයගේ යුතුකමයි. පිදිය යුත්තන් පිදීම මංගල කරුණක් ලෙස මහා මංගල සූත්‍රයෙහි දැක්වෙයි. එසේ ම දස පුණ්‍ය ක්‍රියාවන්හි වැඩිහිටියන්ට සැලකීම වෘද්ධාපචායනය ලෙස සඳහන් වේ. මෙය රටක පරිහානිය වළක්වාලන අභිවෘද්ධිය ඇති කරන ධර්මයක් ලෙස සප්ත අපරිහානීය ධර්මවල දැක්වේ. මේ අනුව වැඩිහිටියන්ට සැලකීම උතුම් ක්‍රියාවකි.

අප වැඩිහිටියන්ට සැලකිය යුත්තේ කුමක් නිසා ද යන්න වටහා ගැනීම අවශ්‍ය ය. ඔවුහු කලක් රටේ, සමාජයේ අභිවෘද්ධිය සඳහා තම කාලය, ධනය, ශ්‍රමය කැප කළහ; අවශ්‍ය ආරක්ෂාව, රැකවරණය මෙන් ම දැනමුතුකම් ලබාදෙමින් සමාජය ගොඩ නැගීමට දායක වූහ. කෙටියෙන් සඳහන් කළොත් වැඩිහිටියන්ට අප සැලකිය යුත්තේ ඔවුන් අද දවසේ අපේ ජීවිත සැපවත් කරලීමට ඊයේ දවස කැප කළ නිසා ය.

වැඩිහිටියන්ට නිසි සැලකිලි දැක්විය යුතු ආකාරය ද අප දැන ගත යුතු ය. එයට අදාළ උපදේශ රැසක් බෞද්ධ කතා පුවත් තුළ දක්නට ලැබේ. තිත්තිර ජාතකය එක් නිදසුනකි. එම කතා වස්තුව අනුව තිරිසන්ගත සතුන් අතුරින් වැඩිහිටියකු ලෙස සැලකිල්ලට ලක් වූයේ ශරීරයෙන් විශාල වූ ඇතා නොව කුඩා සිරුරක් ඇති වටු කුරුල්ලා ය. සාලිකේදාර ජාතකයෙන් තම අසරණ මවුපිය දෙපොළට සැලකූ කුරුලු පැටවකුගේ කතාවක් ඉදිරිපත් කෙරේ. සාම ජාතකයෙහි අන්ධ දෙමාපියන්ට හොඳින් සැලකූ පුතකුගේ තොරතුරු දැක්වේ. භික්ෂු සමාජය තුළ ක්‍රියාත්මක සඟ මහලු පිළිවෙළ අනුගමනය කිරීමෙන් පැහැදිලි වන්නේ පැවිදි උපසම්පදා ශීලයෙන් වැඩිහිටි වූ භික්ෂූන් වහන්සේලාට බාල භික්ෂූන් වහන්සේලා ගරු සත්කාර දැක්විය යුතු ආකාරයයි. මහ මග වැඩම කිරීමේ දී ද, ආසන පිළියෙල කිරීමේ දී, දෛනික විහාර වතාවත්වල දී ද

වැඩිහිටි භික්ෂූන් වහන්සේලාට ප්‍රමුඛත්වය දිය යුතු ය. එසේ නොකිරීම භික්ෂූත්වයට නොගැළපෙන බව චූල්ලතිස්ස තෙරුන් පිළිබඳ කතා පුවතින් හෙළි කර ඇත.

ගිහි සමාජය තුළ බොහෝ දෙනා වැඩිහිටියන්ට නිසි සැලකිලි නොදක්වන අවස්ථා අපට දැකගත හැකි ය. තම දෙමවුපියන්, වැඩිහිටියන් මිටි අසුන්වල සිටින විට වයසින් බාලයින් උස් අසුන්වල හිඳගෙන සිටින අවස්ථා දක්නට ලැබේ. එය නුසුදුසු ක්‍රියාවකි. නොදන්නාකමට එසේ සිටී නම් වැඩිහිටියන් එය නිවැරැදි කිරීමට උපදෙස් දිය යුතු ය. වැඩිහිටියන්ගේ වචනයට ඇහුම්කන් දීමත් ඔවුන් දෙන උපදෙස් පිළිපැදීමත් ඔවුන්ට ගරු කිරීමකි. එම උපදෙස් නොපිළිපැද කටයුතු කිරීමත් ඒවා සමච්චලයට ලක්කිරීමත් ඔවුන්ට නිගරු කිරීමකි. එය කෙනෙකුගේ පිරිහීමට, පසුතැවිල්ලට හේතු වේ. සම වයසේ යහළුවන් සමග කරන කතා බස් විහිළු තහළු අප වැඩිහිටියන් සමග නොකළ යුතු ය. කිසි විටකත් ඒ අයට නම කියා ආමන්ත්‍රණය කිරීම ද නුසුදුසු ය. වයසට හා නෑදෑකමට ගැළපෙන අයුරින් නැන්දේ, මාමේ, අයියේ අක්කේ ආදි ලෙන්ගතු වදනින් ඇමතීමට හුරුවිය යුතු ය. එය අපගේ ගුණගරුක බව පෙන්නුම් කරන්නකි.



ඇතැම් වැඩිහිටියන්ට තම ජීවිතයේ අවසාන කාලයේ දී දිවි ගෙවීමට සිදු ව ඇත්තේ අනාථ නිවාසවල ය. නැතහොත් මහමග යාචකයින් ලෙසිනි. මොවුහු කාගේ හෝ මවුපියෝ ය; ඥාතීහු ය. මේ අය සමග තොරතුරු කතා කරන අයගේ නෙතග කඳුළෙන් තෙත්වනවා නිසැක ය. ඔවුහු එබඳු තැන්වල ජීවිත ගත කළ යුතු අය ද නොවෙති. ඇතැම් විට තම සම්පත් සියල්ල දරුවනට ලබාදීම මේ ඉරණමට හේතුව විය හැකි ය. දරුවන් දෙමාපියන්ට සිගාලෝවාද සූත්‍රයේ සඳහන් යුතුකම් නිසි පරිදි ඉටු කරන්නේ නම් ඔවුහු අසරණ තත්ත්වයට පත් නොවෙති.

## කළගුණ සැලකීම

මිනිසුන් අතර කළගුණ දන්නා කළගුණ සලකන පිරිස දුර්ලභ යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. මෙම උතුම් ගුණය වැඩි වශයෙන් දක ගත හැකි වන්නේ ද බෞද්ධ සමාජය තුළයි. බුද්ධ චරිතයෙන් මෙයට අදාළ ආදර්ශ කොතෙකුත් ලබා ගත හැකි ය.

කළගුණ සැලකීම යන්නෙන් අදහස් කෙරෙන්නේ තමාගේ යහපතට හේතු වන කිසි යම් උදව්වක් උපකාරයක් කළ තැනැත්තාට ප්‍රතිඋපකාර කිරීම ය. බුද්ධ චරිතයෙන් ආදර්ශ ලබා ගත් බොහෝ දෙනා මේ දුර්ලභ ගුණය ක්‍රියාත්මක කළ අයුරු දක ගත හැකි ය. බුදුරදුන් කළගුණ සැලකීමේ අගය ලෝකයාට පෙන්නුම් කළේ බුද්ධත්වයට පත්වීමේදී තමාට පිට දීමට උපකාරී වූ ඇසතු වෘක්ෂයට අනිමිස ලෝචන පූජාව පැවැත්වීමෙනි. එසේ ම උන් වහන්සේ තමා මෙලොවට ජනිත කළ මවට උපකාර කිරීමට තව්තිසා දිව්‍ය ලෝකයට වැඩම කළහ. තමා හැදූ වැඩූ බුද්ධ මාතාව පිරිනිවන් පෑමට අවසර ගෙන පිට ව යන විට තම ශ්‍රාවකයන් වහන්සේලා සමග පසුපසින් වැඩම කළේ කළගුණ සැලකීමක් වශයෙනි.

බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා තුළින් ද මෙම ගුණය පිළිබිඹු වූ අවස්ථා දක්නට ලැබේ. රාත්‍රියේ සැතපීමට පෙර සැරියුත් තෙරණුවෝ තම ගුරුවරයා වූ අස්සජි තෙරුන් වෙසෙන විහාරය දෙසට හැරී වැන්දෝ ය. එසේ කළේ තමන් සසුන් ගත කළ උතුමන්ට කළගුණ සැලකීමක් වශයෙනි. උන් වහන්සේ තම මෑණියනට කළගුණ සැලකීම සඳහා ඇය බෞද්ධ උපාසිකාවක බවට

පත් කළහ. පුණ්ණ තෙරුන් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා තම ජන්ම භූමිය වූ සුණාපරන්තය තෝරාගනු ලැබුවේ ඥාතීන්ට කළගුණ සැලකීමේ අටියෙනි.

කළගුණ සැලකීමේ අගය ජාතක කතාවන්ගෙන් ද ඉගැන්වේ. ඊට අදාළ කතා පුවත් රැසක් ජාතක පොත් වහන්සේ තුළ දැකිය හැකි ය. ඒ අතර ගුණ ජාතකය එක් නිදසුනකි. තමාට උපකාර කළ හිවලා කුලයෙන් ගෝත්‍රයෙන් පහත් වුව ද ඔහුට ප්‍රතිඋපකාර කිරීමට සිංහයා ක්‍රියා කළේ හිවලාගේ පවුලේ සැමට තම වාසස්ථානය සමීපයේ ම නවාතැන් ලබා දීමෙනි.

බුද්ධ චරිතය, බුද්ධ ධර්මය හා ශ්‍රාවක චරිත තුළින් හැඩ ගැසුණු චරිත ඇති බෞද්ධයෝ තමනට උපකාර කළ අයට ප්‍රතිඋපකාර දැක්වීමට අමතක නොකරති; තමන් හැදූ වැඩූ දෙමාපියනට කළගුණ සැලකීමට බෝසත් ගුණ ඇති දරුවෝ මැළි නොවෙති; දෙමාපියන් ගිලන් වූ විට ප්‍රතිකාර ලබා දෙමින් ඔවුනට උවටැන් කරති; වයසට ගිය පසු ආදරයෙන් රැක බලා ගනිති; මිය ගිය පසු ද තම දෙමාපියන්ගේ ගුණ සිහිපත් කරමින් පින් පෙත් ලබා දෙති. මෙබඳු දේ නොකිරීම වසල ක්‍රියාවක් ලෙසත් පිරිහීමේ ලක්ෂණයක් ලෙසත් ඔවුහු බුදු දහම අනුව දැනුම්වත් ව සිටියහ.

තමනට ශිල්ප ලබා දෙමින් නැණ නුවණ වර්ධනය කොට සමාජයට ඇවැසි පුද්ගලයෙකු බවට පත් කිරීමට කැප කිරීම් කළ ගුරු භවතුනට ප්‍රතිඋපකාර කිරීමට සත් පුරුෂයෝ එදා සිට ම යොමු වූහ. තමාගේ මෙලොව පරලොව අභිවෘද්ධියට අදාළ ධර්මය කියා දෙමින් මංගල අවමංගල අවස්ථාවල දී අවශ්‍ය අනුශාසනා කළ අපේ මහසඟරුවන ආරක්ෂා කර ගැනීමටත් සිව්පසයෙන් සංග්‍රහ කිරීමටත් අපේ ජනතාව කැප වුණේ කළගුණ සැලකීම් වශයෙනි. එසේ ම තම ඥාතීන්ට හා අසල්වැසියන්ට අවශ්‍ය ඇප උපකාර කිරීමට බෞද්ධ ජනතාව කිසි විටෙකත් පසුබට නොවුණේ දෛනික ජීවිතයේ දී ඔවුන් තමන්ගේ අභිවෘද්ධිය සඳහා කුමන හෝ අයුරකින් උදවු උපකාර කර ඇති බැවිනි. කෘෂිකාර්මික ජන සමාජය තුළ තිරිසන්ගත සත්ත්වයින්ට ද ප්‍රතිඋපකාර නිරතුරු ව ලැබුණි. එපමණක් නොව ඔවුහු තමන් රැකියාව සඳහා ගනු ලබන උපකරණවලට පවා විශේෂ සැලකිලි දැක්වූහ. නගුලට, උදැල්ලට, පිහියට, යන්ත්‍ර සූත්‍රවලට පවා ඒවා භාවිතයට ගත් පසු වැඳුම් පිදුම් කරන්නේ කළගුණ සැලකීමක් වශයෙනි. පොත පත භාවිත කරන හොඳ දරුවන් පොතක් බිමට වැටුණු පසුත් පාඩම් කර අවසන් වූ පසුත් ඒවාට වඳින්නේ ද කළගුණ සැලකීම් වශයෙනි. අනාදිමත් කලක පටන් පැවතෙන මෙම උතුම් චාරිත්‍ර

නොසලකා හැරීමට ඇතැම් පිරිස් යොමු ව ඇත. එබැවින් අපි මේ උතුම් ගුණධර්ම තව දුරටත් රැකගෙන ඉදිරියට පවත්වාගෙන යෑමට අදිටන් කර ගනිමු.

## ආගන්තුක සත්කාරය

"සිංහලයා ඉතා විනීත ය; ආගන්තුක සත්කාරයේ දක්ෂ ය; ළැදි ය; ස්වදේශිකයන්ට මෙන් ම විදේශිකයන්ට ද කාරුණික ව සත්කාර කරයි." යන ප්‍රකාශය කරනු ලැබුවේ කලක් මෙරට සිරකරුවකු බවට පත් ව සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් විසිනි. එයින් පැහැදිලි වන්නේ ආගන්තුක සත්කාරය නිසා දෙස් විදෙස් දෙපිරිසගෙන් ම අප සම්භාවනාවට ලක් වූ ජාතියක් වූ බවයි.

ආගන්තුකයින් යනු බැහැරින් තම නිවසට පැමිණෙන පිරිස් ය. ඒ අය කලකට පසු ව එන ඥාතීන් විය හැකි ය. එසේත් නොමැති නම් කිසි යම් අවශ්‍යතාවක් සඳහා එන තමන් නොදන්නා අය ද විය හැකි ය. එදා අප නිවෙස්වල ඉදිරිපස දොර වසා නොතිබුණි. වත්තට ඇතුළු වන ගේට්ටුව ද නිතර විවෘත ව තිබුණි. එන ඕන ම අයකු නිවැසියන් විසින් පිළිගනු ලැබුවේ ඉදිරියට පැමිණ සිනහමුසු මුහුණෙනි; කරුණාභරිත වචනවලිනි. නාඳුනන අයකු වුව ද නිවසට කැඳවාගෙන අසුන් ගන්වා ආ ගිය තොරතුරු විමසනු ලබයි. ඒ වන විට නිවසේ ඇති බුලත් හෙප්පුව ඔහුට හෝ ඇයට පිළිගන්වා හමාර ය. ඉන් අනතුරුව පිළිසඳර නිම වන විට බුලතින් පමණක් නොව බතින් ද සංග්‍රහ කිරීමට තරම් අපේ පැරැන්නෝ පරිත්‍යාගශීලී වූහ.

මෙබඳු උතුම් ගුණාංග අපට උරුම වූයේ බුදු දහම මෙරටට දායාද වීමෙන් පසු ව විහාරස්ථානය ඇසුරෙනි. පිටතින් වැඩම කරන භික්ෂූන් වහන්සේලා විහාරවාසී භික්ෂූන් වහන්සේ විසින් පිළිගන්නා ආකාරය ගිහි ජනතාවට ආදර්ශයක් විය. පෙරමගට වැඩම කොට පා සිවුරු පිළිගන්නා ආකාරයත් අනතුරු ව ආසන පනවා පැන් පිළිගැන්වීම් සිදු කරන ආකාරයත් පැරැන්නෝ සියැසින් දුටහ. ආගන්තුක ස්වාමීන් වහන්සේ වයසින් වැඩිමහලු නම් පා වැඳ ආගිය තොරතුරු විමසන අයුරු ද දැන සිටියහ. මේ උතුම් චාරිත්‍ර ගිහි ජනතාව ද තම චර්යා රටාවට යොදා ගත්හ.

බුදුරදුන් විසින් තමා මුණ ගැසීමට පැමිණෙන අය කාරුණික වචනයෙන් හා සිනහමුසු මුහුණින් ප්‍රියශීලී ව පිළිගන්නා ලදහ. සෝණදණ්ඩ නම් උගත්

බ්‍රාහ්මණයෙකු බුදුරදුන් පිළිබඳ ව කරන එක් ප්‍රකාශයක දැක්වෙන්නේ "ඒ ශ්‍රමණ භවත් ගෞතමයෝ තමන් හමුවට එන අය ප්‍රිය වචනයෙන් පිළිගත්තෝ ය." කියායි. අන්‍ය ආගමිකයන් පවා බුදුරදුන් ඔවුන්ගේ අසපුවලට වැඩම කළ අවස්ථාවන්හි දී "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස වඩින සේක්වා. මෙහි වැඩමවීම ඉතා යහපත් ය. භාග්‍යවතුන් වහන්සේ කලකට පසු මෙහි වැඩිසේක. ඔබ වහන්සේට මෙහි ආසනයක් ද පනවා තිබේ," යනුවෙන් ඉතාමත් ලෙන්ගතු ව පිළිගත් බව සූත්‍ර දේශනාවල දැක්වේ.

උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැය කළ යුතු ආකාරය පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන පඤ්ච බලි තුළින් පෙන්වා දෙයි. එහි බලි යනුවෙන් දක්වා ඇත්තේ යුතුකම් ය. අථිති බලි ඉන් එකකි. එනම් ආගන්තුකයින්ට යුතුකම් ඉටු කිරීම සඳහා ද තමන් උපයන ධනයෙන් කොටසක් වැය කළ යුතු බවයි. ඔවුන්ට ආහාර පාන, ඉඳුම් හිටුම් ආදි මූලික පහසුකම් සැපයීමට එමගින් ඉගැන්වෙයි.

මේ සියලු සංග්‍රහ අපේ පැරැන්නන් විසින් සිදුකරනු ලැබුවේ මතුවට මොන යම් ආකාරයකින්වත් ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් නොවේ. හුදෙක් අන්‍යයන්ගේ යහපත සලසා දීමේ උදාර අරමුණිනි. ඔවුහු කිසි විටෙකත් තම නිවසට පැමිණෙන අය කරදරයක් ලෙස නොසිතූහ.

## අග්‍රශෂ්‍ය දානය

දූරාතීතයේ පටන් ම ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. එය බුදුරදුන් විසින් ද අනුමත දැහැමි රැකියාවන්ගෙන් එකකි. කෘෂි කර්මාන්තයේ දී වගා කරන භෝග අතර වී ප්‍රධාන තැන ගනී. අපේ ජන සමාජය එය බුද්ධ භෝග ලෙස සලකයි. ඒ නිසා ම වී වගාව හා සම්බන්ධ ආගමික චාරිත්‍ර ද රැසක් පවතී. අග්‍රශෂ්‍ය දානය පිරිනැමීම එයින් එක් චාරිත්‍රයකි. මෙය අලුත් බත් දානය ලෙස ව්‍යවහාරයේ පවතී. කුමන නමකින් හැඳින්වුව ද එයින් අර්ථවත් කෙරෙන්නේ කුඹුරුවලින් අස්වනු ලබා ගැනීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීමයි.

මෙම දානය පිළියෙල කිරීමේදීත් පිළිගැන්වීමේදීත් විශේෂ සැලකිල්ලකින් එය සිදු කරනු ලැබේ. කුඹුරේ දී අස්වැන්න නෙළන විටත් කමතේ දී බැත රාසි කරන විටත් ඒ හා සම්බන්ධ වන කිසි ම අයෙක් වී ඇටයක් පවා සැපීමක් නොකරති. එයට හේතුව අග්ගසස්ස දීමට මත්තෙන් එවැන්නක් කිරීම අයෝග්‍ය දෙයක් ලෙස සැලකීම ය. කෘෂිකාර්මික කටයුතු ආරම්භ කරන විට මෙන් ම අස්වනු නෙළාගත් විට ද ආගමික කටයුතු සිදු කෙරේ. පිරිසිදු සිතින් වැඩ කටයුතු අරඹා පිරිසිදු සිතින් ම අස්වනු පරිහරණය කිරීම එමගින් සිදුවේ. අග්‍රශෂ්‍ය දානය තමන් වෙහෙස මහන්සි වී ලබා ගත් අස්වැන්නෙන් පිංකම් කිරීමට යොමු වීමකි. එය පැරණි ගොවියන් සිරිතක් වශයෙන් ම ඉතා ගෞරවයෙන් හා සතුටින් ඉටු කළ බව පෙනේ.



පැරණි ගොවියෝ වී අස්වැන්නේ මුල් කොටස පමණක් නොව සෙසු භව භෝගවල මුල් කොටස ද විහාරස්ථානයට පූජා කිරීම සිරිතක් කරගෙන සිටියහ. ගෙවත්තේ හැදුණු කෙසෙල් කැනේ මුල් ඇවරිය, දොඩම් ගසේ මුල් වරට එල ගත් ගෙඩිය පිරිසිදු සිතින් පූජා කිරීමට ඔවුහු නිර්ලෝභී වූහ. එපමණක් නොව කුළුඳුල් පැටියෙකු බිහිකළ දෙනගෙන් දොවා ගත් කිරි ටික පවා පූජා කරනු ලැබුවේ ඇගේ තිරිසන් භවය නිම කරලීමේ පින් සිතුවිල්ලෙනි.

## භික්ෂු නායකත්වය පිළිගැනීම

බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ධර්මයෙහි පිහිටා එම ධර්ම මාර්ගය ජනතාවට කියාදෙන පූජනීය උතුමන් වන්නේ භික්ෂූන් වහන්සේලා ය. බුද්ධ උපදේශයට අනුව තමන් වහන්සේලාට ආමිස දානයෙන් සංග්‍රහ කරන ගිහියාට ධර්ම දානයෙන් සංග්‍රහ කිරීම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන කාර්යභාරය විය. නමුත් උන් වහන්සේලා පසු කාලයේ ජනතාවට ධර්මය කියාදීමෙන් පමණක් නොනැවතුණහ. ගිහි ප්‍රජාවගේ මෙලොව ජීවිතය සරු කර ගැනීමට අදාළ බොහෝ කටයුතුවලට ද උන් වහන්සේලා සම්බන්ධ වූහ. ඒ අනුව භික්ෂූන් වහන්සේලා ආගමික, සාමාජික, දේශපාලනික යන සෑම ක්ෂේත්‍රයක ම නියමුවන් බවට පත් වූ බව ඉතිහාසයෙන් පැහැදිලි ය. භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනා හිස් මුදුනින් පිළිගැනීමට පැල්පතේ වෙසෙන දිළින්දාගේ පටන් රජ මැඳුරේ සිටින රජතුමා දක්වා වූ සියලු දෙනා ම සැදී පැහැදී සිටිය බව පෙනේ.

බුදු දහම මෙරටට ලැබීමෙන් පසු පාලකයන් එතෙක් තම උපදේශකයන් වූ බමුණන් වෙනුවට උගත් සිල්වත් භික්ෂූන් වහන්සේලා පත්කර ගත් බව පෙනේ. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගෙන් උපදෙස් ගැනීමට දේවානම්පියතිස්ස රජු ක්‍රියා කළ තැන් පටන් බෞද්ධ පාලකයන් සෑම කෙනෙකු ම පාහේ උපදෙස් ලබා ගත්තේ භික්ෂූන් වහන්සේගෙනි. ලොකු කුඩා සියල්ලෝ ම භික්ෂු නායකත්වයට ගරු කළහ. භික්ෂූන් වහන්සේ සමාජයේ ගුරුවරයා බවට ද ප්‍රජා නායකයා බවට ද පත්වූහ.

උපතේ සිට මරණය දක්වා පුද්ගල ජීවිතය හා බැඳුණු වැදගත් අවස්ථාවල දී පන්සලේ හාමුදුරුවන්ගේ අවවාද අනුශාසනා හා ආශීර්වාදය බෞද්ධයෝ අපේක්ෂා කළහ. ඉපදීමට සිටින දරුවාගේ හා මවගේ ආරක්ෂාව සඳහා අංගුලිමාල පිරිත කියවා ගත්තේත්, ඉපදුණ දරුවාගේ වේලපත්කඩය සකස් කරගනු ලැබුවේත්, සුදුසු නමක් සකස් කරගත්තේත්, ඉඳුල් කටගෑම සිදු කළේත් විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගෙනි. දරුවාට අකුරු කියවීමට ද ආවාහ විවාහ කටයුතුවල දී ආශීර්වාද ලබා ගැනීමට ද ගියේ පන්සලට ය. තමනට ඇතිවන ඕනෑ ම ගැටලුවක් විසඳාගනු ලැබුවේ ස්වාමීන් වහන්සේලා මුණගැසී උපදෙස් ලබා ගැනීමෙනි. පවුල තුළ හෝ සමාජය තුළ ඇතිවන ගැටුම්, ආරවුල් සංසිඳවන ලද්දේ පන්සලේ හාමුදුරුවන් විසිනි. උන් වහන්සේ

ඒවා විසඳුවේ සාධාරණ ව ය. ඒ නායකත්වයට ගැමියෝ හිස නමා ගරු කළහ. රජවරුන් අතර ඇතිවූ අර්බුද පවා විසඳාලීමට භික්ෂූන් වහන්සේ නායකත්වය ගත් අවස්ථා ගණනාවක් පිළිබඳ ව ඉතිහාසයේ දක්වේ. දුටුගැමුණු හා සද්ධාතිස්ස කුමරුන් අතර ඇති වූ ගැටුම නිරාකරණය කිරීම එයට එක් නිදසුනකි. ඇතැම් රජවරුන් විසින් අගවිනිසුරු තනතුරට පවා භික්ෂූන් වහන්සේ පත්කරගෙන ඇත. ගෝදත්ත තෙරුන් පිළිබඳ කතා පුවත එයට නිදසුනක් වේ.

විදේශීය වශයෙන් ඇති වූ ආක්‍රමණවල දී ද ඒවාට විසඳුම් සෙවීමට නායකත්වය ගෙන ක්‍රියා කළේ භික්ෂූන් වහන්සේලා ය. වාරියපොල සුමංගල හිමි, කුඩාපොල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ සුමංගල හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි වැනි උතුම් ස්වාමීන්ද්‍රයන් වහන්සේලා අමරණීය බවට පත් වූයේ විවිධාකාරයෙන් ජාතියට නායකත්වය ලබාදීම නිසා ය.



## සාරාංශය

මෙරට සංස්කෘතිය දෙස් විදෙස් බොහෝ දෙනාගේ ඇගයීමට පාත්‍ර වූයේ බුදු දහමින් පෝෂිත සමාජ ධර්මවලින් එම සංස්කෘතිය හැඩ ගැන්වුණු බැවිනි. ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, කළගුණ සැලකීම, අග්‍රශෂ්‍ය දානය දීම එම සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණවලින් කිහිපයකි. භික්ෂූන් වහන්සේගේ නායකත්වය හා මගපෙන්වීම ද නිබඳ ව ඉතිහාසය පුරා දක්නට ලැබේ.



## ක්‍රියාකාරකම

1. වැඩිහිටියන් වෙනුවෙන් කළ යුතු යැයි අපේක්ෂා කරන යුතුකම් පහක් ලියන්න.
2. ආගන්තුකයින්ට සංග්‍රහ කිරීමේ දී ඔබ අනුගමනය කරන ක්‍රියාකාරකම් පෙළගස්වන්න.
3. අග්‍රශෂ්‍ය දානය යනු කුමක් ද යි හඳුන්වන්න.
4. භික්ෂූන් වහන්සේගේ නායකත්වය ප්‍රකට කෙරෙන අවස්ථා තුන බැගින් පහත සඳහන් වගුවේ දක්වන්න.

| ආගමික | සාමාජික | දේශපාලනික |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |



## පැවරුම

"කළගුණ සැලකීම දුර්ලභ ගුණයකි" යන මාතෘකාව පදනම් කරගෙන පුවත් පතකට ලියන ලිපියක් සකස් කරන්න.